Department of Education Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School



# 19 පාඩම - සන්ධි

## ➢ ඉගනුම් ඵල :-

- සන්ධි යනු මොනවාදැ'යි අර්ථ ගන්වයි.
- භාෂාව රසවත් කර ගැනීමට හා වචන කෙටි කර ගැනීමට සන්ධි පද භාවිත කරන බව කියයි.
- නියමිත පෙළ පොත් භාවිත කරමින් සන්ධි පද සොයා ලියයි.

1. මාතෘකාව හඳුනා ගැනීම පිණිස පෙළ පොතේ 169 පිටුව හොඳින් කියවන්න.
2. එහි ඇති රූප සටහනේ දක්වා ඇති පරිදි 'සන්ධි' යන්න හඳුන්වන්න.
3. සන්ධි කාර්යය නිසා ඇති වැදගත් කරුණු 3ක් ලියන්න.
4. සිංහල භාෂාවේ ඇති සන්ධි විධි 10 හඳුනා ගන්න.
5. එම සන්ධි විධි 10ට අදාළ නිදසුන් හොඳින් අවබෝධ කර ගන්න.
6. එක් එක් සන්ධි විධිය සඳහා නිදසුන් සාහිත්‍ය සංග්‍රහය පෙළ පොතේ 1, 2, 10, 11 සහ සිංහල භාෂාව පෙළ පොතේ 1, 12 යන පාඩම් වලින් සොයා ලියන්න.
7. මුනිදාස කුමාරතුංග සිංහල භාෂාවේ ව්‍යාකරණ පොත සොයාගෙන 'සන්ධි' පාඩමට අදාළ කරුණු සොයා ලියන්න.

ඇගයීම :- හරි නම් √ ලකුණද වැරදි නම් X ලකුණද යොදන්න.

I. සන්ධි පදයක් යනු පද දෙකක් ගැළපීම ය. (.........)

II. සිංහල භාෂාවේ සන්ධි විධි බොහොමයකි. (.........)

III. 'මුණිතුමා' යනු සන්ධි පදයකි. (.........)

IV. මල්+අසුන යන පද දෙක ගලපා සන්ධියක් සාදා ගත හැකිය. (.........)

V. පැරණි සාහිත්‍ය ගත් කතුවරු සන්ධි පද බොහෝ සෙයින් භාවිත කළ බව දැකිය හැකිය. (.........)